

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

වාර්ෂික වාර්තාව - 2019

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
අංක . 01, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ -10.

දැක්ම

සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්

මෙහෙවර

තිරසර සංවර්ධනය උදෙසා මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහිකිරීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යාලය

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටුවා ඇති දැනට ප්‍රවාහන අමාත්‍යාංශයේ ස්ථාපනය කර ඇති කාර්යාල පරිශ්‍රයේ කොටසක මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය ස්ථාපනය කර ඇත.

කාර්යාලීය ලිපිනය -

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
අංක . 01,
ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ -10.

දුරකතනය කාර්යාලය	-	0112696890
ෆැක්ස්	-	0112680163
විද්‍යුත් තැපැල් ලිපිනය	-	ncrstransport@gmail.com

පටුන

වාර්ෂික වාර්තාව - 2019
(2019.01.01 සිට 2019.12.31)

විස්තරය	පිටු අංකය
හැඳින්වීම	04
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභා සාමාජික සංයුතිය	05
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය මණ්ඩලය	06
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු	07
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන්	08
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්	09 – 13
මාර්ග අනතුරු දත්ත	14 - 16
මාර්ග අරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම්	17
වාර්ෂික ගිණුම්	18 - 37
විගණකාධිපති වාර්තාව	38 - 45
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	46 - 48

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

හැඳින්වීම

1998 අංක 05 දරණ මෝටර් වාහන සංශෝධන පනතේ 213 අ සහ 213 ආ වගන්ති යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇත. ඒ අනුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන විෂයය භාර අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුළුව රාජ්‍ය ආයතන 16 ක සහ එක් රාජ්‍ය නොවන ආයතනයක නියෝජිතයෙකු ඇතුළු නියෝජිතයන් 17 කින් සමන්විත ආයතනයකි. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන මෙම සියලු ආයතන මෙරට ප්‍රවාහන හා මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ වගකිවයුතු රාජ්‍ය ආයතන වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන ආදායම් ලබා දෙනු ලබන්නේ රක්ෂණ සමාගම් මගින් වන අතර, 2004 නොවැම්බර් 24 දිනැති අංක 1368/18 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල සම්බන්ධයෙන් බලය ලබා දී ඇත. එහි සඳහන් පරිදි , ‘‘තෘතීය පාර්ශවයේ අවධානමක් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් රක්ෂණය කරන සෑම රක්ෂණ ආයතනයක් විසින් අරමුදලට වාරික මුදලින් සියයට එකක් (1%) දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතුය.’’ ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රක්ෂණ සමාගම් තම ආයතන මගින් රක්ෂණය කරනු ලබන තෙවන පාර්ශවීය සියලුම වාහන සඳහා අයකෙරෙන රක්ෂණ ගාස්තු මුදලින් 1% ක වටිනාකමින් යුත් මුදල 2004 දෙසැම්බර් 01දින සිට බලාත්මක වන පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලට බැර කළ යුතුය.

මෙම අරමුදල මගින් ඉටු කළයුතු කාර්යභාරයන් පිළිබඳව 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/04 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත.ඉන් එක් වගකිවයුතු ප්‍රධාන කාර්යයක් වනුයේ මාර්ග අනතුරු සිදු කර නොනවත්වා පලා යන වාහන හඳුනාගත නොහැකි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම වාහන අනතුරු වලට ගොදුරු ව මියගිය හෝ ආබාධිත තත්වයට පත් පුද්ගලයන්ට සභාව මඟින් අනුමැතිය ලබා දී ඇති ආකාරයට වන්දි මුදල් ප්‍රදානය කිරීමයි.

මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම, අනතුරු අවම කිරීම, පදික හා මඟී ජීවිත අනතුරු වලට ලක්වීම වළක්වා ගැනීම, මහජනයා දැනුවත් කිරීම ඒ සඳහා අවශ්‍ය නව නීති ඇතුලත් කිරීම හෝ දැනට තිබෙන නීති සංශෝධනය කිරීම සඳහා විෂය භාර අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම ඇතුළු සමස්තයක් ලෙස සියලුම පිඩාකාරී ක්‍රියා බැහැර කරමින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයන් සඳහා මෙම අරමුදලෙහි තැන්පත් වන මුදල් ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත.

එසේම මාර්ග ආරක්ෂාව පිළිබඳ සියලු පරිපාලන හා අනෙකුත් වියදම් දැරීමද මෙම අරමුදල මඟින් සිදු කළ යුතුය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා සාමාජිකයන්

01 වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා	-	සභාපති, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
02 ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා	-	ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
03 එම්.යූ.එස් .ප්‍රියදර්ශන මහතා	-	ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
04 .බී.ඒ.ඩබ්.ආර්. පද්මශාන්ත මහතා	-	සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය.
05.කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මහතා	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල්හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.
06.නයනා නාථවිතාරණ මිය	-	අති. ලේකම් (පාලන), පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යාංශය.
07. ඩී.එම්.කේ.එස්. දිසානායකමහතා	-	අධ්‍යක්ෂක(ඉංජිනේරු) , මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය
08. එච්.ආර්.පසිදු මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය
09. ඩී.එම්.බී. රණතුංග මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරල් (සැලසුම්), නාගරික සංවර්ධන අධිකාරිය
10. ආර්.ඒ.සුදත් මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්) , මාර්ග සංවර්ධන අධිකාරිය
11. එන්.වී.එන්.ඩී. ජයවර්ධන මිය	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
12. ජනක මල්ලිමාරච්චි මහතා	-	සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව
13. ජේ.ඒ. එස්.ජයවීර මහතා	-	සහකාර කොමසාරිස් (කාර්මික), මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
14. පී.ඩී. බාලසූරිය මහතා	-	ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
15. කේ.එස්.එම්.සමරසේකර මිය	-	ප්‍රධාන වෛද්‍ය නිලධාරී, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
16. ධම්මික ආටිගල මහතා	-	සභාපති, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් සංගමය
17. ඉන්දික හපුගොඩ මහතා	-	අධ්‍යක්ෂ, (රථ වාහන) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
18. ජී.ඒ.සී.ආර්. ගනේපොල මහත්මිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂක (රථ වාහන), කොළඹ මහ නගර සභාව
19. සී.පී.අයි.ද සිල්වා මිය	-	ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී , ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
20. ගිහාන් රාමනායක මහතා	-	සභාපති, ශ්‍රී ලංකා අනතුරු වැලැක්වීමේ සංගමය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යය මණ්ඩලය.

1.	වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා	-	සභාපති , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2.	ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා	-	ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
3.	එම්.යු.එස් .ප්‍රියදර්ශන මහතා	-	ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.
4.	ඩබ්.පි.ජේ.සෙව්වන්දිකා මිය	-	සංවර්ධන නිලධාරී
5.	ජේ.ඩී.ආර්.ජයසිංහ මිය	-	සංවර්ධන නිලධාරී
6.	කේ.බී.එන්.ගිෂාන් කුමාර් මහතා	-	සංවර්ධන නිලධාරී
7.	අයි.එන්.පි.ජයසිංහ මිය	-	කළමනාකරණ සේවා නිලධාරී
8.	පි.ඒ.චිත්‍රානි ජයතිස්ස මිය	-	කළමනාකරණ සේවා නීලධාරී
9.	බී.පි.ඒ.රුවන් මහතා	-	ලිපිකරු
10.	ඊ.ජී. එස්.ඒකනායක මහතා	-	සංවර්ධන නිලධාරී
11.	ජී.ඒ.බුද්ධික ප්‍රභාත් මහතා	-	තාක්ෂණ ශිල්පී සහයක
12.	කේ.එල්.ඩී.එන්.ජයවර්ධන මහතා	-	කාර්යාල කාර්ය සහයක
13.	පී.ඒ.වානකී පැළවත්ත මිය	-	කාර්යාල කාර්ය සහයක
14.	කේ.ඩී.එච්.දිල්හානි මිය	-	කාර්යාල කාර්ය සහයක

අරමුණු

- විනය ගරුක හා නීති ගරුක රියදුරන් බිහි කිරීම තුළින් ඉහළ ගුණාත්මක රියදුරු සේවාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- හප්පා පලා යෑම නිසා විඳින්දිත වූ පවුල් සඳහා මූල්‍යාධාර ලබා දීම සහ එවැනි අනතුරු අවම කිරීමට ක්‍රියා කිරීම.
- මාර්ගය සහ එය භාවිත කරන වාහන හා ගමන් ගන්නා මගීන් ඇතුළු පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත එක් රැස් කිරීම, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ අන්තර් ජාතික සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම.
- රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සමග එක්ව ජාතික මාර්ග ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා පැන නැගෙන දුර්වලතා අවම කර ගැනීම.
- මාර්ග අනතුරු නිසා ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා මාර්ග අනතුරු අවම කිරීමට අදාලව ආර්ථික තාක්ෂණික සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී ආරක්ෂිත පියවරවල් අනුගමනය කිරීම සඳහා මූල්‍යාධාර සහ උපදෙස් ලබාදීම.
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමට හා එහි ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබා දීම.
- මාර්ග ආරක්ෂාවට අදාල නීති සැකසීම සංශෝධනය වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු කාර්යභාරය හා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් බලය ලබාදී ඇත්තේ 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/4 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගිනි. එම ගැසට් පත්‍රය මගින් නියෝග කර ඇති පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් සිදුකළයුතු කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) පහත දැක්වෙන දෑ පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම.

I. රථ වාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය.

II. මාර්ග අනතුරු

III.මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන.

(ආ) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

(ඇ) සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.

(ඈ) සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණ වලට ආධාර කිරීම.

(ඉ) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම සහ පළපුරුදු පිළිබඳ දැනුම හුවමාර කර ගැනීම.

(ඊ) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන අදාල ආයතන වලට දැනුම හා තොරතුරු ලබාදීම.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම.

(ඌ) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඔ) හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.

(ඕ) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

(ඒ) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් ලබාදීම.

2019 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්.

01.2019 වර්ෂය තුළ මාර්ග ආරක්ෂණ ව්‍යාපෘති සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.

1.1.අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා දැනුවත් කිරීමේ පුවරු සවි කිරීමේ ව්‍යාපෘතිය.

අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග වලදී සිදුවන අනතුරු හේතුවෙන් වසරක් පාසා රටට අහිමි වන ජීවිත හා දේපල වල වටිනාකම දිනෙන් දින ඉහළ යයි. මෙම තත්වය අවම කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව දුම්රිය හරස් මාර්ගයේ , දුම්රිය ස්ථානයේ දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම හා දුම්රිය මගීන් දැනුවත් කිරීමේ උපදේශාත්මක වැකි සහිත පුවරු ස්ථාපිත කිරීම සිදු කර ඇත.

දිනය	දුම්රිය ස්ථානය	ක්‍රියාකාරකම
2019.01.12	කළුතර අළුත්ගම	දුම්රිය මගීන් දැනුවත් කිරීමේ උපදේශාත්මක වැකි සහිත පුවරු ස්ථාපිත කිරීම
2019.03.23	වැලිගම, අහංගම.කඹුරුගමුව	
2019.03.30	අලව්ව , පොල්ගහවෙල	
2019.06.26,27,28	යාපනය, වව්නියාව	
2019.10.24,25	බදුල්ල	





දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම - බදුල්ල

02 මාර්ග අනතුරු පිළිබඳ පාසල් සිසුන්, දැනුවත් කිරීම වැඩසටහන් ක්‍රියාක්මක කිරීම.

- 2019 වර්ෂයේ මාර්ග අනතුරු පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර, එහිදී මාර්ග සංඥා නීති සම්බන්ධයෙන් මෙන්ම අනතුරු මඟහැර පදිකයෙකු ලෙස ආරක්ෂිතව මාර්ගය භාවිත කළ යුතු ආකාරය සම්බන්ධව හා එවැනි අනතුරුකදී නිසි නිවැරදි ප්‍රතිකාර පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම ක්ෂේත්‍රයේ නිපුණතාවයන් සහිත නිලධාරීන් ගෙන්වා සිදු කරන ලදි.

දිනය	ස්ථානය	ක්‍රියාකාරකම්
2019.02.11	ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය	මාර්ග අනතුරු පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම
2019.06.13	පොල්ගහවෙල සෙන් බර්නඩේත් විද්‍යාලය	මාර්ග අනතුරු පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම
2019.06.24	කුරුණෑගල මාවතගම මධ්‍ය මහා විද්‍යාලය	මාර්ග අනතුරු පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම





පාසල් ළමුන් දැනුවත් කිරීම - ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය

03. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වෙබ් අඩවිය එළි දැක්වීම.

2019.06.19 දින ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ හා රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.





මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වෙබ් අඩවිය එළි දැක්වීම. - ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

04. ත්‍රීරෝද රථ රියදුරන් හා පාසල් වෑන් රථ රියදුරන් දැනුවත් කිරීම.

විනයානුකූල රියදුරු සේවාවක් ඇති කිරීම අරමුණු කරගෙන කුරුණෑගල පොලිස් බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ රියදුරන් හා පාසල් වෑන් රථ රියදුරන් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල බ්‍රාවෝ හෝටලයේදී පැවැත්විය.

එමෙන්ම උසස් ත්‍රීරෝද රථ සේවාවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මහනුවර පොලිස් බල ප්‍රදේශයේ ත්‍රී රෝද රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මහනුවර තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී පැවත්වන ලදී.

05.රාජ්‍ය නිලධාරීන් ,පුද්ගලික අංශ නිලධාරීන් හා රාජ්‍ය හා පෞද්ගලික රියදුරු මහතුන් දැනුවත් කිරීම .

- 2019.07.28 දින නිට්ටඹුව සංඝබෝධි විද්‍යාල ක්‍රීඩාංගනයේදී ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජංගම සේවා වැඩසටහනක් පැවති අතර, එහිදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් පාසල් ළමුන් රාජ්‍ය නිලධාරීන් හා පුද්ගලික අංශ නිලධාරීන් දැනුවත් කරන ලදී.එහිදී අත්පත්‍රිකා බෙදා දීම වීඩියෝපට ප්‍රදර්ශනය ,පෝස්ටර් බැනර් ප්‍රදර්ශනය මඟින් ද ජනතාව දැනුවත් කිරීම.
- 2019.09.19 දින මාතර මහ රෝහලේ වෛද්‍යවරුන්, හෙදියන් හා ගිලන් රථ රියදුරන් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් එම රෝහල් පරිශ්‍රය තුළ සිදු කළ අතර,රෝහල් පරිශ්‍රයේ දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම ද සිදු කරන ලදි.
- මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා රිය අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් 2019.09.24 ශාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ එහි කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- 2019.09.27 හා28 දෙදින යාපනය කිලිනොච්චිය , වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක වල රියදුරු පාසල් භිමියන් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත් වන ලදී.
- 2019.10.11 දින කෑගල්ල රෝහලේ වෛද්‍යවරුන් හෙදියන් හා කාර්ය මණ්ඩලය මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- 2019.10.21 දින පේරාදෙණිය රෝහලේ වෛද්‍යවරුන්, හෙදියන් හා කාර්ය මණ්ඩලය මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- රජයේ හා පෞද්ගලික බස්රථ ජනතාව අතර, වඩාත් ආරක්ෂාකාරී ප්‍රවාහන මාධ්‍ය ලෙස ප්‍රචලිත කිරීම සඳහා 2019.09.17 දින කොළඹ බැස්ටියන් මාවතේ ප්‍රධාන බස් නැවතුම්පලේදී බස් රථ රියදුරු මහතුන් හා කොන්දොස්තර මහතුන් නොමිලේ පූර්ණ වෛද්‍ය පරීක්ෂාවකට භාජනය කරන ලද අතර,එහිදී රුධිර පීඩනය දියවැඩියාව මෙන්ම මත්ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා මෙම පරීක්ෂාව සිදු කරන ලදි.

06. පළාත් මාර්ග ආරක්ෂණ ඒකක පිහිටුවීම.

2019.08.01 දින උතුරු පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය උතුරු පළාත් ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් උතුරු පළාත් ප්‍රධාන කාර්යාලයේදී පවත් වන ලදී. ඒ සඳහා පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා රාජ්‍ය නිලධාරීන් සහභාගී විය.

07. හප්පා පලායාම නිසා වින්දිත භාවයට ලක්වන්නන් සඳහා මූල්‍යාධාර ලබාදීම.

ස්ථාවර කමිටුවේ සහ ජාතික සභාවේ අනුමැතිය ලද වින්දිතයින් සඳහා 2019 වර්ෂයට අදාලව අවස්ථා හතරකදී මූල්‍යාධාර ලබා දීම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කර ඇත.

දිනය	ස්ථානය	වින්දිතයින් ප්‍රමාණය	ගෙවන ලද වන්දි මුදල රු. ලක්ෂ
2019.01.23	මරදාන අමාත්‍යාංශ ශ්‍රවනාගාරය	20	24
2019.06.14	මහවැලි කේන්ද්‍ර ශ්‍රවනාගාරය	27	40
2019.07.28	නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලයේ දී	10	14
2019.11.28	වින්දිතයාගේ බැංකු ගිණුම වෙත ගිණුම් ගත කරන ලදි.	10	13



වින්දිතයන් සඳහා මූල්‍ය සහන ලබා දීම - ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

08.යොවුන් පුරය ජාතික වැඩසටහන

2019.03.26 සිට 31 දක්වා හම්බන්තොට වීරවිල යොවුන් පුරය ජාතික වැඩසටහන පැවති අතර, එහිදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ කුටියක් පවත්වාගෙන යන ලදී. එහිදී මාර්ග අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් පාසල් ළමුන් රාජ්‍ය නිලධාරීන් හා පුද්ගලික අංශ නිලධාරීන් දැනුවත් කිරීම සිදු විය. අත් පත්‍රිකා බෙදා දීම වීඩියෝපට ප්‍රදර්ශනය ,පෝස්ටර් බැනර් ප්‍රදර්ශනය මඟින් ද ජනතාව දැනුවත් කිරීම සිදු කරන ලදි.

- **එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ජාතික වැඩසටහන**

2019.09.07 සිට 2019.09.10 දක්වා යාපනයේ පැවති එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා වැඩසටහන පැවති අතර,එහිදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ කුටියක් පවත්වාගෙ යන ලදී. මාර්ග අනතුරු සම්බන්ධයෙන් පාසල් ළමුන්, රාජ්‍ය නිලධාරීන් හා පුද්ගලික අංශ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන ලද අතර, අත්පත්‍රිකා බෙදා දීම , වීඩියෝපට ප්‍රදර්ශනය ,පෝස්ටර් හා බැනර් ප්‍රදර්ශනය මඟින් ද ජනතාව දැනුවත් කරන ලදි.





එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා වැඩසටහන - යාපනය

09.මාර්ග අනතුර් පිළිබඳ දත්ත

2019 වසර මාරක අනතුරු වලට වගකිව යුතු වාහන	
වගකිවයුතු වාහනය	මාරක
යතුරුපැදි	1186
ලොරි	354
ත්‍රීවිල්	341
කාර්	235
වෑන්	184
පුද්ගලික බස්	200
කැබ්	108
ලංගම බස්	40
ට්‍රැක්ටර්	41
පා පැදි	37
ජීප්	33
කන්ටේනර්	10
බවුසර්	15
අත් ට්‍රැක්ටර්	02
වෙනත්	04
හප්පා පළායෑම	61
එකතුව	2851

මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිසිය

2019 වර්ෂය තුළ දිවයිනේ සිදු වූ රිය අනතුරු ප්‍රමාණය

වර්ෂය	මාරක	බරපතල	සුළු	අලාභ	එකතුව	මියගිය
2019	2688	7718	10679	9391	**30476**	**2851**

මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිසිය

2019 මියගිය සංඛ්‍යාව

2019	
පදිකයින්	**889**
යතුරුපැදි කරුවන්	**932**
පසුපැදි කරුවන්	**166**
රියදුරන්	**235**
මගීන්	**399**
පාපැදි කරුවන්	**229**
වෙනත්	**01**
එකතුව	**2851**

මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිසිය

2019 වර්ෂයේ මිය ගිය සංඛ්‍යාව



2019 වර්ෂයේ මිය ගිය සංඛ්‍යාව



මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම්.

01. අමානා ටකාෆුල් රක්ෂණ සමාගම	-	නො 660/1, ගාලු පාර, කොළඹ - 03.
02. අලියාන්ස් රක්ෂණ සමාගම	-	නො 46/10 නවම් මාවත, කොළඹ - 02.
03. සෙලින්කෝ රක්ෂණ සමාගම	-	3 වන මහල, ‘‘සෙලින්කෝ නිවාස’’, නො 69, ජනාධිපති මාවත, කොළඹ - 01.
04. කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම	-	නො 79, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත, කොළඹ - 07
05. සී./ස. සමූපාකාර රක්ෂණ සමාගම	-	‘‘රක්ෂණ නිවාස’’,නො 74/05, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ - 14.
06. එච්.එන්.බී. රක්ෂණ සමාගම	-	නො 30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ - 03.
07. එල්.ඕ.එල්.සී. රක්ෂණ සමාගම	-	නො 481, ටී.බී ජයා මාවත, කොළඹ - 10.
08. ජාතික රක්ෂණ භාරකාර අරමුදල	-	නො 97, මරදාන පාර, කොළඹ -10.
09. එම්.බී.එස්.එල් රක්ෂණ සමාගම	-	අංක 122, කිව් පාර, කොළඹ - 02
10. ඔරියන්ට් රක්ෂණ සමාගම	-	අංක.79,සි.ඩබ්.ඩබ් කන්නන්ගර මාවත,කොළඹ 07.
11. පිපල්ස් රක්ෂණ සමාගම	-	නො 53,ධර්මපාල මාවත, කොළඹ - 03.
12. සී/ස සණස රක්ෂණ සමාගම	-	නො 340, 2/1, ආර්.ඒ.ද.මෙල් මාවත,කොළඹ - 03.
13. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	-	නො 21, වොක්ෂෝල් වීදිය , කොළඹ - 02.
14. ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම	-	ඇක්සස් ටවර්ස් 11,(14 වන මහල) නො.278/4 යුනියන් පෙදෙස, කොළඹ 02.

වාර්ෂික ගිණුම් - 2019

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා

		2019	2018
		රු.	රු.
ආදායම්	**සටහන්**		
රක්ෂණ සමාගම් වලින් ලැබුණු දායක මුදල	1	44,902,844.33	44,386,270.00
වෙනත් ආදායම්	2	29,506,478.10	28,772,459.13
මුලු ආදායම		**74,409,322.43**	**73,158,729.13**
අඩුකිරීම – වියදම්	4	14,943,405.65	13,670,965.57
වියදමට වඩා ආදායමේ අතිරික්තය (ශුද්ධ අතිරික්තය (ඌණතාවය) වර්ෂය සඳහා)		**59,465,916.78**	**59,487,763.56**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2019	2018
		රු.ශ.	රු.ශ.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	5	7,727,538.08	7,646,313.55
ජංගම නොවන වත්කම්වල එකතුව		7,727,538.08	7,646,313.55
ස්ථාවර තැන්පතු		91,606,733.27	84,000,000.00
භාණ්ඩාගාර බිල්පත්	3	250,234,059.36	229,569,677.16
ජංගම වත්කම්			
රක්ෂණ සමාගම් වලින් ලැබෙන අයවිය යුතු මුදල		3,661,311.68	3,397,889.23
අයවිය යුතු ස්ථාවර තැන්පත් පොලිය		1,884,353.38	2,014,945.20
අයවිය විය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලිය		1,938,329.90	2,027,925.00
ඉදිරි ගෙවීම්		-	40,859.33
බැංකුවේ තිබෙන මුදල	6	62,878,499.21	31,818,550.63
ජංගම වත්කම්වල එකතුව		**412,203,286.81**	**352,869,846.55**
අඩුකිරීම්- ජංගම වගකීම්			
ගෙවිය යුතු විගණන ගාස්තුව		375,000.00	353,232.00
ගෙවියයුතු වෙනත් ගාස්තු		-	73,020.00
		375,000.00	426,252.00
ශුද්ධ වත්කම්වල එකතුව		**419,555,824.89**	**360,089,908.10**
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලේ ගිණුම			
අරමුදල් ගිණුමේ ශේෂය	B/F	360,089,908.10	300,602,144.54
වියදමට වඩා ආදායම් අතිරික්තය		59,465,916.78	59,487,763.56
මුළු අරමුදල		**419,555,824.89**	**360,089,908.10**

මෙම මූල්‍ය ප්‍රකාශනවල 5 වන පිටුව සිට සංකලිත කොටසේ දක්වා සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන්

සහතිකකරණය

ඉහත මූල්‍ය ප්‍රකාශන මගින් 2017 දෙසැම්බර් 31 දින වන විට සහ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා එහි අතිරික්තය/ (හිඟය) මගින් එහි කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත්වන බව සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම හා ඉදිරිපත්කිරීම පිළිබඳව මෙම සභාවේ වගකීයනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන සභාව විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබනු ලැබේ.

ගණකාධිකාරී
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

M. U. S. Priyadarshana
Accountant
Ministry of Transport Services Management
7th Floor, Sethsiripaya (Phase II)
BATTARAMULLA

Dr. (Mrs.) K.S.M. Samaraweera
Chief Medical Officer
M.P.B.S. (Sri Lanka) Ph.D. (Hons)
SLMC Reg. No. 6
National Transport Medical Institute
No. 170, High Level Road
Nugegoda

ආර්. ඒ. කේ. රේණුකා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දුම්රිය පාලන)
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය.
7 වන මහල, සෙත්සිරිපාය අදියර II
බත්තරමුල්ල.

සභාපති
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

සභාපති
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය
අංක 1, ඒ ආර්.වි.පෙරේරුන් ...
කොළඹ 10

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

වක්‍ර ක්‍රම මුදල් ප්‍රවාහ ප්‍රකාශය (මුදල් ප්‍රවාහ ප්‍රකාශය)
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා

	2019	2018
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය	රු	රු
බදු පෙර ලාභය	59,465,916.78	59,487,763.56
පූර්ව වර්ෂයේ ගැලපුම් (ශුද්ධ) සඳහා		
ගැලපුම්		
ක්ෂයවීම	1, 066,275.47	450,477.45
ස්ථාවර වත්කම් ප්‍රදානය	-	(5,281,320.00)
පොලී ආදායම	(29,342,978.10)	(22,845,127.14)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	31,189,214.15	31,811,793.87
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
වෙළඳ සහ වෙනත් අයවියයුතු මුදල් අඩුවීම/ (වැඩිවීම)	(2,376.20)	(4,054,609.44)
වෙළඳ ණය අඩුවීම/ (වැඩිවීම)	(51,252.00)	268,893.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල	31,135,585.95	28,026,077.43
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල	31,135,585.95	28,026,077.43
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
දේපළ පිරියත සහ උපකරණ මිළ දී ගැනීම	(1,147,500.00)	(521,011.0)
ලැබුණු පොළිය	29,342,978.10	22,845,127.14
ස්ථාවර තැන්පත් නැවත ආයෝජනය	(7,606,733.27)	(70,000,000.00)
භාණ්ඩාගාර බිල්පත් නැවත ආයෝජනය	(20,664,382.20)	(17,567,408.31)
ආයෝජන ක්‍රියාකාරකම් වල දී භාවිත වූ ශුද්ධ මුදල	**(75,637.37)**	**(65,243,292.17)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
කොටස් ප්‍රාග්ධනය නිකුත්කිරීමෙන් ලත් මුදල	-	-
දීර්ඝ කාලීන වලින් ණය වලින් ලත් මුදල්	-	-
මූල්‍ය කල්බදු වගකීම් ගෙවීම	-	-
ගෙවන ලද ලාභාංශ	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වල දී භාවිතවන ශුද්ධ මුදල	-	-
මුදල් හා මුදල් උපකරණවල ශුද්ධ වැඩිවීම	**31,059,948.58**	**(37,217,214.74)**
කාල ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් උපකරණ	**31,818,550.63**	**69,035,765.37**
කාල සීමාව අවසානයේ දී මුදල් සහ මුදල් උපකරණ	**62,878,499.21**	**31,818,550.63**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
භිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනට

	අරමුදල් ගිණුම රු.	එකතුව රු.
2017/01/01 දිනට ශේෂය	260,040,799.57	260,040,799.57
වියදමට වඩා ආදායම් අතිරික්තය (යළි උපලේඛනගත කරන ලදී.)	40,561,344.97	40,561,344.97
2017/12/31 දිනට ශේෂය	300,602,144.54	300,602,144.54
වියදමට වඩා ආදායම් අතිරික්තය (යළි උපලේඛනගත කරන ලදී.)	59,487,763.56	52,006,537.33
2018/12/31 දිනට ශේෂය	360,089,908.10	352,608,681.87
වියදමට වඩා ආදායම් අතිරික්තය	59,465,916.78	57,042,514.40
2019/12/31 දිනට ශේෂය	419,555,824.89	409,651,196.27

01 ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය

මෙම සභාව ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර 1998 අංක 5 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් ස්ථාපනය කරන ලදී. සභාවේ කටයුතු සිදුකිරීම සඳහා විධිවිධාන මගින් 213 (අ), 213(ආ) වශයෙන් අතිරේක නව වගන්තීන් හඳුන්වා දෙන ලදි. සභාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතේ අංක 01 දරන ස්ථානයේ පිහිටි ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පිහිටා තිබේ.

02 සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

1.2 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කර තිබෙන මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර තිබේ.

2.1.2 අනුකූලතා ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 වනවිට සහ ඉන් අවසන්වන වර්ෂය සඳහා සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් (මූල්‍ය ප්‍රකාශනය) සමඟ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සමකොටස්වල සහ මුදල් ප්‍රවාහවල වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවේ.

2.2 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම්

2.2.1 දේපළ, පිරියත සහ උපකරණ

(අ) අඩු පිරිවැය සමුච්චිත ක්ෂයවීමකට දේපළ, පිරියත සහ උපකරණ වාර්තාකරනු ලැබේ.
(ආ) ක්ෂයවීම

සෘජු රේඛීය පදනම භාවිතාකර ක්ෂය සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. සමානුපාතිකව මිළ දී ගත් දිනයේ දී වත්කමෙහි ඵලදායී ජීවකාලය මත මෙම ප්‍රතිපත්තිය යොදාගන්නා ලදී.

පහත දැක්වෙන පරිදි භාවිතා කරන ලද මූලික වාර්ෂික අනුපාත

01. පරිගණකය / යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ	-	25%
02. ගෘහභාණ්ඩ සහ මෙවලම්	-	10%
03. ගොඩනැගිලි සහ ව්‍යුහ	-	12.5%
04. රියදුරු පුහුණු උපකරණ	-	10%

සමාලෝචනයට යටත් වර්ෂය තුළ ස්ථාවර වත්කම් සඳහා ඇතැම් එකතු කිරීම් සිදුකළ නමුත් බැහැර කිරීමක් සිදු නොකරන ලදී.

2.3 ආයෝජන

රක්ෂණ සමාගම් වලින් මාසික පදනම මත මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්ව මුදල් ලැබෙන අතර අතිරේක අරමුදල් භාණ්ඩාගාර බිල්පත් සහ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කරනු ලැබේ.

(අ) ජංගම ආයෝජන

පිරිවැය ප්‍රතිපාදනයෙහි සඳහන් ජංගම ආයෝජන වටිනාකම පහත වැටීම පිළිබඳව ගණනය නොකරන ලද අතර භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන පොළී ආදායම කල්පිරීමේ දී ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

2.4 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් යටතේ සඳහන් වගකීම් මූල්‍ය තත්ත්ව දිනයේ සිට වසර එකක කාලය තුළ පහත වැටෙන බව අපේක්ෂා කෙරේ.

2.4.1 වෙනත් ගෙවීම්

ණයහිමියන් සහ කළ යුතු වෙනත් ගෙවීම් ඔවුන්ගේ පොත් අගයන්හි දක්වා තිබේ.

2.4.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සභාවට යම් වගකීමක් පවතින විට ප්‍රතිපාදන හඳුනා ගැනෙන අතර, එහි දී එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්ව සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර, වගකීමේ ප්‍රමාණයෙන් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සකස්කළ හැකිය.

2.5 මාර්ග ආරක්ෂණ අරමුදලේ ආදායම

ලියාපදිංචි රක්ෂණ සමාගම් දහහත විසින් සිය රක්ෂණ ඔප්පුවල තෙවන පාර්ශව රක්ෂණ වාරික වලින් 1% ක දායකත්වය ලබා දෙනු ලැබේ. ඊළඟ මාසයේ 15 දිනට පෙර ඔවුන් විසින් සිය මාසික දායකත්ව මුදල් ගෙවිය යුතුය.

2.6 කාර්ය මණ්ඩලය

සභාවේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනම මත සම්බන්ධීකාරකයෙකු පත්කර තිබේ.ඔහුගේ දීමනාව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලෙන් ගෙවනු ලැබේ. ගණකාධිකාරීවරයා ඉංග්‍රීසි ලඝු ලේඛකයින්ගෙන් සමන්විත අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ සිට මාර්ග ආරක්ෂක සභාව වෙත ස්ථාන මාරුකර තිබේ. අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවනු ලබන්නේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය විසිනි.

2.7 <u>දෝෂ</u>

සභාව විසින් සිය අණාවරණය කරගැනීම් වලින් පසුව නිකුත්කිරීම සඳහා බලය පවරන ලද පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි ඇතුලත් පූර්ව කාලසීමාවට අදාළ දෝෂ :

(අ) දෝෂය සිදු වූ පූර්ව කාලසීමාව(න්) සඳහා ඉදිරිපත්කර තිබෙන සංසන්දනාත්මක මුදල් නැවත සඳහන් කිරීම; හෝ

(ආ) ඉදිරිපත්කර තිබෙන මුල්ම පූර්ව කාලසීමාවට පෙර දෝෂය සිදුවී තිබේ නම්, ඉදිරිපත් කරන ලද මුල්ම පූර්ව කාලසීමාව තුළ වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම්/ සමකොටසෙහි ආරම්භක ශේෂයන් යළ උපලේඛනගත කිරීම

මගින් අතීතයට බලපාන පරිදි නිවැරදි කරනු ලැබේ.

මෙම වර්ෂය තුළ පූර්ව මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතැම් දෝෂ හඳුනාගන්නා ලද අතර 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය යළි උපලේඛනගත කිරීමෙන් ඒවා නිවැරදි කරන ලදී. දෝෂයේ ස්වභාවය , 2018 වර්ෂයේ දී පෙර ඉදිරිපත් කරන ලද මුදල මත එහි බලපෑම සහ යළි උපලේඛනගත කරන ලද ශේෂයන් පහත සාරාංශගත කර තිබේ.

2018 වර්ෂයේ දෝෂ නිවැරදිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන වෙනස්කම්වල බලපෑම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය මත බලපෑම

		2018		
අයිතමය	**සටහන**	**පෙර වාර්තා කරන ලද ශේෂය**	**ගැලපුම**	**යළි උපලේඛනගත ශේෂය**
වියදම්				
අළුත්වැඩියා සහ කාර්යාල නඩත්තුව	2.7.1	1,452,571.39	(47,359.00)	1,405,212.39
මුද්‍රණය සහ පරිවර්තනය	2.7.2	178,103.50	(6,000.00)	172,103.50
වාහන නඩත්තුව	2.7.3	1,232,884.50	(40,859.33)	1,192,025.17
ක්ෂය	2.7.5	418,283.75	32,193.70	450,477.45
ස්ථාවර තැන්පත් පොළී රැඳවුම් බද්ද	2.7.6	7,419.61	(7,419.61)	-
වන්දි (හප්පා පලායාමේ අනතුරු)	2.7.7	5,200,000.00	75,000.00	5,275,000.00
විගණන ගාස්තු වියදම්	2.7.12	238,260.00	182,102	420,362.00
ආදායම්				
වෙනත් ආදායම්	2.7.6 2.7.5 2.7.9 & 2.7.10	21,624,586.14	7,147,873.99	28,772,459.13

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මත බලපෑම

අයිතම	සටහන	පෙර වාර්තා කන ලද ශේෂය	ගැලපුම	යළි උපලේඛන ශේෂය
ඉදිරි ගෙවීම	2.7.3	-	40,859.33	40,859.33
දේපළ, පිරියත සහ උපකරණ	2.7.4 &2.7.5	1,819,786.25	5,826,527.30	7,646,313.55
වෙනත් ගෙවීම්	2.7.5	-	73,020.00	73,020.00
භාණ්ඩාගාර බිල්පත් ආයෝජන	2.7.8	235,548,983.16	(5,979,306)	229,569,677.16
භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබියයුතු පොළිය	2.7.8	-	2,027,925.00	2,027,925.00
ලැබියයුතු ස්ථාවර තැන්පත් පොළිය	2.7.9	140,972.60	1,873,972.60	2,014,945.20

සමකොටස්වල වෙනස්කම් ප්‍රකාශය මත බලපෑම

විස්තරය	**සටහන**	**2017**
පූර්වයෙහි වාර්තාගත වියදමට වඩා ආදායමේ අතිරික්තය		44,959,713.23
<u>**දෝෂ නිවැරදිකිරීම**</u>		
පවිත්‍රතා කටයුතු සඳහා අයකිරීම්වල දෝෂ නිවැරදිකිරීම	2.7.1	(47,359.00)
ඡායාපිටපත් අයකිරීම්වල දෝෂ නිවැරදිකිරීම	2.7.2	(6,000.00)
පරිගණක පහෙහි ක්ෂයවීම් නිවැරදිකිරීම	2.7.4	(16,630.00)
අදාළ කාලසීමාව තුළ අවලංගුකරන ලද වන්දි වාර්තාකිරීම	2.7.7	75,000.00
වැඩි අගයන් වාර්තාගත කර තිබෙන භාණ්ඩාගාර බිල්පත් නිවැරදි කිරීම	2.7.8	(3,951,381.00)
2017 දී වියදමට ඉක්මවා ගිය දෝෂ නිවැරදිකිරීම	2.7.11	(451,998.26)
යළි උපලේඛනගත කරන ලද ශේෂය		**40,561,344.97**

2.7.1 - ජේ/ඊ 15

2017 වර්ෂයට අදාළ රු. 47,359.00 ක පිරිසිදුකිරීමේ ගාස්තුව දෝෂ සහගත ලෙස 2018 වර්ෂයේ වියදමක් ලෙස වාර්තාගතකර තිබේ. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යළි උපලේඛනගත කරමින් එය නිවැරදි කර ඇත.

2.7.2 - ජේ/ඊ 17

2017 වර්ෂයට අදාළ රු.6,000.00 ක ඡායාපිටපත් ගාස්තුව දෝෂ සහගත ලෙස 2018 වර්ෂයේ දී වියදමක් ලෙස වාර්තාගතකර තිබේ. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යළි උපලේඛනගත කරමින් මෙය නිවැරදි කර ඇත.

2.7.3 - ජේ/ඊ 18

2019 මූල්‍ය වර්ෂය සඳහා අදාළ රු. 40,859.00 ක රක්ෂණ වාරිකයක් 2018 වර්ෂයේ දී ගෙවා තිබබේ. නමුත් මෙය 2018 මූල්‍ය ප්‍රකාශනයෙහි වියදමක් ලෙස දෝෂ සහගත ලෙස වාර්තාගතකර තිබෙන අතර ඒවා යළි උපලේඛනගත කිරීමෙන් නිවැරදිකර තිබේ.

2.7.4 - ජේ/ඊ 19

පරිගණක පහෙහි ක්ෂයවීම 2017 මූල්‍ය ප්‍රකාශනවල වාර්තාගතකර නැත. මෙම පරිගණක 2017 දෙසැම්බර් මස 02 වන දින මිළ දී ගෙන තිබෙන අතර 2017 වර්ෂය සඳහා අදාළ ක්ෂයවීම රු. 16,630.00 කි. 2018 මූල්‍ය ප්‍රකාශන යළි උපලේඛනගත කිරීමෙන් මෙය නිවැරදි කරන ලදී.

2.7.5 - J/E 11 & J/E 10

ජපාන රජය විසින් 2018 වර්ෂයේ දී මෙම සභාවට රියදුරු ඉගැනුම් යන්ත්‍රයක් ප්‍රදානය කරන ලද අතර එය 2017 මූල්‍ය ප්‍රකාශනවල වාර්තාගත කර නොතිබුණි. එම වත්කමේ වටිනාගම සක්‍රීය වෙළඳපොළ මිළ ගණන් සැලකිල්ලටගෙන තීරණය කරන ලදී. එය රු. 5,587,351 වන අතර එම වටිනාකමෙන් නැවිගත කිරීමේ ගාස්තුව රු. 73,000 ක් වන අතර එය 2018 දෙසැම්බර් 31 වන විට ගෙවා නොතිබී අතර එය සභාව විසින් ගෙවිය යුතුව තිබිණි. එබැවින්, එය ජංගම වගකීමක් ලෙස වාර්තාගත කරන ලදී. නිෂ්කාශන ගාස්තුව ලෙස රු. 521,011 ක් 2018 දී සභාව විසින් ගෙවන ලදී.

සභාවේ ක්ෂයවීම් පිළිබඳ ප්‍රතිපත්තිය අනුව වත්කම්වල ක්ෂයවීම ගණනය කර වාර්තාගත කරන ලද අතර 2018 වර්ෂයේ ක්ෂයවීම් සඳහා ගාස්තුව රු. 32,193.70 කි.

2.7.6 – ජේ/ඊ 20

පොළී රැඳවුම් බද්ද 2018 වර්ෂයේ දී වියදමක් ලෙස වාර්තාගත කර තිබෙන අතර පොළී ආදායම දළ වටිනාකම ලෙස වාර්තාගතකර තිබුණි. පොළී ආදායම රු. 7,419.61 ක ශුද්ධ වටිනාකම පොළී ආදායම ලෙස වාර්තාගත කරමින් මෙම දෝෂය නිවැරදි කරන ලදී.

2.7.7 – ජේ/ඊ 21

2017 වර්ෂයේදී වන්දි ලෙස ගෙවන ලද රු.75,000.00 මුදලක් 2018 වර්ෂයේදී අවලංගු කර ඇත. එම මුදල 2018 වර්ෂයේදී වියදමින් අඩු කලබවට නිවැරදි කර ඇත.

2.7.8 – ජේ/ඊ 22 & ජේ/ඊ 23

2018 ජනවාරි 01 දින රු. 3,951,381 ක වැඩි වටිනාතමකින් යුත් භාණ්ඩාගාර බිල්පත් ආදායම්වල සහ 2018 වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනයෙහි වාර්තාගත කරන ලද උපචිත පොලී ආදායමෙහි දෝෂ නිවැරදි කිරීම. ජංගම වත්කම් යටතේ භාණ්ඩාගාර බිල්පත් මත ලැබියයුතු පොලී ආදායම ලෙස වාර්තාගත කරන ලද උපචිත පොලී ආදායම රු. 2,027,925.00 කි.

2.7.9 - ජේ/ඊ 13

2018 වර්ෂයේ දී ලැබුණු රු. 646,00 ක ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන ස්ථාවර තැන්පත් පොලී ආදායම ලෙස වාර්තාගත කිරීමේ තිබෙන දෝෂය නිවැරදි කිරීම.

2.7.10 ජේ/ඊ 12

2018 වර්ෂය සඳහා මිලියන 30 ක සහ මිලියන 40 ක් ලෙස හඳුනාගෙන තිබෙන ස්ථාවර තැන්පත් පොලී ආදායමෙහි දෝෂ නිවැරදි කිරීම. 2018 වර්ෂයේ දී මෙම ස්ථාවර තැන්පතු දෙකෙහි නිවැරදි පොළිය රු. 1,873,973.00 කි.

2.7.11 – ජේ/ඊ 16

2017 වර්ෂයේ රු. 451,998 ක් ලෙස සඳහන් දෝෂය නිවැරදි කිරීමට 2018 වර්ෂයේ දී සම්මත කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ජර්නල් ප්‍රවේශවල දෝෂ නිවැරදි කිරීම.

2.7.12 – ජේ/ඊ 14

2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන යටතේ විගණන ගාස්තුවත් තිබෙන අතර 2018 වර්ෂයේ ගිණුම් යළි උපලේඛනගත කිරීමෙන් නිවැරදි කරන ලදී. මුදල රු. 182,102.00 කි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

රක්ෂණ සමාගම් වලින් ලැබුණු දායක මුදල් - **2019**

රක්ෂණයේ නම	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
එච්.එන්.බී ජෙනරල් රක්ෂණ සමාගම	87,590.00	84,870.00	77,885.00	98,465.00	67,270.00	89,605.00	91,585.00	101,585.00	99,675.00	86,720.00	91,520.00	78,700.00	1,055,470.00
අමනා ටකාෆුල් රක්ෂණ සමාගම	167,679.41	161,083.56	158,446.13	187,378.77	128,013.41	106,883.20	135,734.93	130,478.13	137,226.10	137,228.22	129,538.47	101,906.68	1,681,597.01
සෙලින්කෝ ජෙනරල් රක්ෂණ සමාගම	362,565.98	398,481.38	359,855.49	419,592.47	404,039.31	382,715.70	375,701.05	435,874.82	416,228.36	380,569.56	390,338.71	360,564.83	4,686,527.66
එම්බීඑස්එල් රක්ෂණ සමාගම	-	-	-	-	-	-	7,251.03	4,703.36	4,698.52	4,178.34	5,106.29	4,569.36	30,506.90
කෝපරේටිව් රක්ෂණ සමාගම	282,447.41	317,060.81	281,632.00	237,099.00	289,191.00	294,389.00	284,236.00	313,440.00	334,383.00	336,729.00	471,951.00	442,282.00	3,884,840.22
ඔරියන්ට් රක්ෂණ සමාගම	45,055.00	129,940.00	94,620.00	106,170.00	82,260.00	88,805.00	77,910.00	113,395.00	91,770.00	117,451.30	110,488.22	96,669.60	1,154,534.12
සී/ස ඝණඝ රක්ෂණ සමාගම	75,612.90	88,497.74	80,457.19	94,982.50	92,842.68	94,618.74	85,304.74	97,889.12	96,858.09	95,701.26	111,373.61	96,107.78	1,110,246.35
අලයන්ස් රක්ෂණ සමාගම	306,418.00	299,142.00	290,305.00	316,410.00	280,488.00	220,422.00	269,130.00	300,650.00	312,225.00	290,122.50	306,555.00	319,285.00	3,511,152.50
ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	877,490.49	871,602.21	795,538.43	918,770.39	808,027.04	904,611.09	820,155.04	937,224.70	897,788.63	902,181.40	909,578.00	754,207.00	10,397,174.42
පීපල්ස් රක්ෂණ සමාගම	153,334.99	167,596.90	137,386.23	164,524.03	132,092.61	138,714.12	153,354.43	169,613.24	180,329.75	168,627.75	176,832.99	168,805.31	1,911,212.35
කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම	95,813.00	113,079.00	117,272.00	133,264.00	87,899.00	122,340.00	107,445.00	120,869.00	114,134.00	108,467.00	113,396.00	99,108.50	1,333,086.50
එල්ඕඑල්ඕ රක්ෂණ සමාගම	65,830.00	391,410.00	234,805.00	235,120.00	238,895.00	265,320.00	271,000.00	289,805.00	283,125.00	291,060.00	309,355.00	266,255.00	3,141,980.00
නැෂනල් ඉන්ෂුවරන්ස් ට්‍රස්ට ෆන්ඩ්	47,513.05	34,987.15	43,609.20	149,324.45	18,663.70	25,260.10	16,253.35	19,940.85	27,217.60	18,249.90	23,272.40	27,333.10	451,624.85
ෆෙයාර් ෆස්ට රක්ෂණ සමාගම	830,539.00	837,560.00	803,830.00	923,660.00	768,885.00	898,300.00	872,725.00	843.955.00	930,200.00	784,345.00	941,355.00	854,115.00	10,289,469.00
එකතුව	**3,397,889.23**	**3,895,310.75**	**3,475,641.67**	**3,984,760.61**	**3,398,566.75**	**3,631,983.95**	**3,567,785.57**	**3,879,423.22**	**3,925,859.05**	**3,721,631.23**	**4,090,660.69**	**3,669,909.16**	**44,639,421.88**

2019 වර්ෂය සඳහා රක්ෂණ දායකත්වය

	2019	2018
	රු	රු
වර්ෂය තුළ රක්ෂණ ලැබීම්	44,639,421.88	44,296,903.25
එකතු කිරීම		
2019.12.31 දිනට ලැබියයුතු රක්ෂණය	3,661,305.68	3,397,889.23
	48,300,727.56	47,694,792.48
අඩුකිරීම		
2016.12.31 දිනට ලැබිය යුතු රක්ෂණය	3,397,889.23	3,308,522.48
	44,902,838.33	**44,386,270.00**

සටහන 02
වෙනත් ආදායම්

	2019	2018
	රු	රු
භාණ්ඩාගාර බිල්පතු පොළිය	20,574,791.39	19,595,333.31
ස්ථාවර තැන්පත් පොළිය	8,768,186.72	3,249,793.83
භාණ්ඩාගාර බිල්පත් ගැලපුම් ආදායම	-	11.99
ජපත් රජයේ අධාර	-	5,281,320.00
වෙනත්	163,500.00	646,000.00
වෙනත් ආදායම් එකතුව	**29,506,478.10**	**28,772,459.13**

සටහන **04**

භාණ්ඩාගාර බිල්පත්

බිල්පත් අංකය	**2019** දෙසැම්බර් **31** දිනට ආයෝජනය කරන ලද මුදල	**2019** වර්ෂය සඳහා ආයෝජනය කරන ලද ආදායම
1	11,464,716	911,185
2	38,913,353	3,104,444
3	6,864,690	545,588
4	10,101,472	802,838
5	17,845,894	1,487,429
6	732,120	61,021
7	27,433,077	2,200,190
8	12,181,170	1,017,663
9	8,927,157	709,506
10	90,252,492	7,522,414
11	27,458,399	2,202,221
12	77,812	6,486
13	45,633	3,803
එකතුව	**252,297,985**	**20,574,789**

සටහන – 04

<u>වියදම්</u>

	2019 රු	2018 රු
දීමනා	1,326,988.42	1,977,450.24
වාහන සඳහා ඉන්ධන	915,672.90	649,104.76
සභා සාමාජිකයින්ගේ ගාස්තු	327,500.00	74,500.00
සභාවේ උපදේශකයින්ගේ ආදායම	42,000.00	-
වන්දි (හප්පා පලා යාමේ)	7,400,000.00	5,275,000.00
අලුත්වැඩියා හා කාර්යාල නඩත්තුව	1,095,073.02	1,405,212.39
වාහන නඩත්තුව	179,874.04	1,192,025.17
ලිපිද්‍රව්‍ය වියදම්	267,801.24	354,246.64
දුරකතන ගාස්තු	165,286.57	152,504.40
පුවත්පත්	125,320.00	108,800.00
මුද්‍රණය සහ පරිවර්තනය	106,750.00	172,103.50
අතිකාල ගෙවීම්	289,826.20	248,304.96
දැන්වීම්කරණය සහ ප්‍රචාරණය	515,270.00	619,097.00
රැස්වීම් සඳහා තේපැන් සංග්‍රහ වියදම්	364,173.12	322,963.81
විගණන ගාස්තු	375,000.00	420,362.00
ගමන් වියදම්	125,111.00	118,793.25
විවිධ වියදම්	33,510.00	21,518.00
ක්ෂය	1,066,275.47	450,477.45
නවාතැන් සැපයීම	37,300.00	78,680.00
තැපැල් ගාස්තු	450.00	2,422.00
ආදායම් බදු	17,400.00	14,400.00
කාර්ය මණ්ඩල පුහුණු	166,821.53	13,000.00
භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම්	2.14	-
	14,943,405.65	**13,670,965.57**

සටහන -05

දේපළ ,පිරියත සහ උපකරණ

	පරිගණක	ජායා පිටපත්/ මුද්‍රණ යන්ත්‍ර	ගෘහ භාණ්ඩ සහ මෙවලම්	වායු සමීකරණ	මාධ්‍ය උපකරණ	වෙනත් වත්කම්	රියදුරු පුහුණ කථටල	ශීතකරණ	එකතුව
පිරිවැය /ප්‍රත්‍යාගණනය	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු
2017/01/01 දිනට ශේෂය	713,500.00	140,700.00	641,500.00	139,800.00	540,362.50	62,207.50	5,875,351.00		8,113,421.00
වර්ෂය තුළ									
එකතු කිරීම්					1,014,500.00			133,000.00	
බැහැර කරනු ලබන ද්‍රව්‍ය									
2019.12.31 දිනට ශේෂය	713,500.00	140,700.00	641,500.00	139,800.00	1,554,862.50	62,207.50	5,875,351.00	133,000.00	9,260,921.00
සමුච්චිත අවපාතය									
2019/01/01 දිනට ශේෂය	195,005.00	17,587.50	128,300.00	17,475.00	70,225.00	6,321.25	32,193.70	-	467,107.45
වර්ෂය සඳහා අයකිරීම්	133,781.25	15,389.06	102,640.00	15,290.63	188,011.71	13,971.56	587,535.10	9,656.16	1,066,275.47
2019.12.31 දිනට ශේෂය	**328,786.25**	**32,976.56**	**230,940.00**	**32,765.63**	**258,236.71**	**20,292.81**	**619,728.80**	**9,656.16**	**1,533,382.92**
ශුද්ධ පොත් අගය									
2018/12/31 දිනට	518,495.00	123,112.50	513,200.00	122,325.00	470,137.50	55,886.25	5,843,157.30	-	7,646,313.55
2019/12/31 දිනට	384,713.75	107,723.44	410,560.00	107,034.37	1,296,625.79	41,914.69	5,255,622.20	123,343.84	7,727,538.08

2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම (ගැලපීමට පෙර)

	හර	බැර
වත්කම්		
පරිගණක	713,500.00	
ඡායා පිටපත්, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර	140,700.00	
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	641,500.00	
වායු සමීකරණ	139,800.00	
ඩී.වී.ඩී යන්ත්‍ර ආදිය	1,554,862.50	
වෙනත් වත්කම්	62,207.50	
කැමරා	-	
රියදුරු ඉගැනුම් යන්ත්‍ර	-	
ශීතකරණය	133,000.00	
උපචිත ක්ෂය		
පරිගණක		312,156.25
ඡායාපිටපත්, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍රය		32,976.56
ගෘහ භාණ්ඩ සහ මෙවලම්		230,940.00
වායු සමීකරණ		32,765.63
ඩී.වී.ඩී යන්ත්‍ර ආදිය		258,236.71
වෙනත් වත්කම්		20,292.81
කැමරා		
රියදුරු ඉගැනුම් යන්ත්‍ර		587,535.10
ශීතකරණය		9,656.16
ස්ථාවර තැන්පත්	84,000,000.00	
භාණ්ඩාගාර බිල්පත්	235,548,983.16	
භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම		2.14
රක්ෂණ සමාගම් වලින් අයවීම්	3,397,889.23	
අරමුදල් ගිණුම		356,555,051.87
රක්ෂණ සමාගමෙන් දායකත්වය		44,639,421.88
ස්ථාවර තැන්පත් පොලී ගිණුම		1,292,045.27
ලැබියයුතු ස්ථාවර තැන්පත් පොලී ගිනුම	140,972.60	
විගණන ගාස්තු ගිණුම		192,898.00
වාහන සඳහා ඉන්ධන	915,672.90	
සභා උපදේශක ගාස්තු	327,500.00	
සභා සාමාජික දීමනා	1,326,988.42	
වන්දි	7,400,000.00	
අලුත්වැඩිය සහ නඩත්තු	1,095,073.02	
වාහන නඩත්තු	139,014.71	
ක්ෂය	1,066,275.47	
ලිපිද්‍රව්‍ය වියදම්	267,801.24	
දුරකථන ගාස්තු	165,286.57	
පුවත්පත්	125,320.00	
මුද්‍රණය සහ පරිවර්තනය	106,750.00	
අතිකාල ගාස්තු	289,826.20	
දැන්වීම්කරණය සහ ප්‍රචාරණය	515,270.00	
රැස්වීම් සඳහා තේපැන් සංග්‍රහ	364,173.12	
ගමන් වියදම්	125,111.00	
විවිධ වියදම්	33,510.00	
බැංකු ශේෂය	62,878,499.21	
නවාතැන්පළ ගාස්තු	37,300.00	
තැපැල් ගාස්තු	450.00	
කාර්ය මණ්ඩල පුහුණු	166,821.53	
ව්‍යාපෘති (ව්‍යවසාය ශ්‍රී ලංකා)	42,000.00	
ආදායම් බදු	17,400.00	
Aවිගණන ගාස්තු	375,000.00	
තෑගි සහ වෙනත්		**163,500.00**
මුදලින් ගෙවිය යුතු	73,020.00	
	404,327,478.38	**404,327,478.38**

ජර්නල් ප්‍රවේශය -2019

J1	ස්ථාවර තැන්පත් පොලී ගිණුම (හර)	140,972.60	
	ස්ථාවර තැන්පත් අයවිය යුතු ගිණුම		140,972.60
	(පසුගිය වර්ෂය සඳහා කරන ලද ගැලපුම්)		
	ලැබියයුතු ස්ථාවර තැන්පතු පොලී ගිණුම		
J2	රක්ෂණ සමාගම් වලින් ලැබෙන දායක මුදල් (හර)	3,397,883.23	
	රක්ෂණ සමාගම් වලින් ලැබෙන දේ		3,397,883.23
	භාණ්ඩාගාර බිල්පත් පොළී ගිණුම		
	(රක්ෂණ සමාගම් වලින් පසුගිය වර්ෂය සඳහා ලැබියයුතු මුදල් සඳහා ගැලපුම්		
	රක්ෂණ සමාගම් වලින් ලැබියයුතු මුදල් (හර)	3,661,305.68	
J3	රක්ෂණ සමාගම් වලින් ලද දායකත්ව මුදල්		3,661,305.68
	(2019.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා රක්ෂණ සමාගම් වලින් ලැබිය යුතු මුදල් සඳහා		
	ගැලපුම්		
J4	ලැබියයුතු ස්තාවර තැන්පත් පොලී ගිණුම	1,884,353.38	
	ස්ථාවර තැන්පත් පොළී ගිණුම		1,884,353.38
	(2019.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්තාවර තැන්පත් වලින්		
	කරන ලද ගැලපුම්)		
J7	ස්ථාවර තැන්පත් ගිණුම (හර)	7,606,733.38	
	ලැබියයුතු ස්ථාවර තැන්පත් පොලී ගිණුම බැර		1,873,972.60
	ස්ථාවර තැන්පත් පොලී ගිණුම		5,732,760.67
	පොලී ආදායම වාරතාගත කිරීම සහ ස්ථාවර තැන්පත් නැත ආයෝජනය කිරීම		
	ස්ථාවර තැන්පත්වල පොලී ආදායම – අංක 4 සහ 5 2019ග12ග31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා පොලී ආදායම)		
J5	ක්ෂය	1,066,275.47	
	පරිගණක		133,781.25
	ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර සහ ෆැක්ස් යන්ත්‍ර		15,389.06
	ගෘහ භාණ්ඩ සහ මෙවලම්		102,640.00
	වායු සමීකරණ		15,290.63
	ඩිවිඩි යන්ත්‍ර ආදිය		58,767.19
	වෙනත් වත්කම්		13,971.56
	කැමරා		129,244.52
	රියදුරු ඉගැනුම් යන්ත්‍ර		587,535.10
	ශීතකරණ යන්ත්‍ර		9,656.16
	(ක්ෂය සඳහා ප්‍රතිපාදන		
	2019.12.31දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ගැලපුම)		
J6	විගණන ගාස්තු ගිණුම (හර)	375,000.00	
	ගෙවියයුතු විගණන ගාස්තු ගිණුම		375,000.00
	(2019 වර්ෂය සඳහා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන)		
J8	භාණ්ඩාගාර බිල්පත් ගිණුම (හර)	18,636.457	
	භාණ්ඩාගාර බිල්පත් මත ලැබෙන පොලිය	1,938,332	
	භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම		20,574,789.25
	(2019.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ප්‍රග්ධනීකෘත		
	භාණ්ඩාගාර බිල්පත්)		
J9	වාහන නඩත්තු වියදම්	40,859.33	
	ඉදිරි ගෙවීම		40,859.33
	(2019 වර්ෂය තුළ වියදම් සඳහා පසුගිය වසර තුළ රක්ෂණ ගාස්තු ඉදිරි ගෙවීම)		

2018 මූල්‍ය ප්‍රකාශන යළි උපලේඛනගත කිරීම සඳහා ජර්නල් ප්‍රවේශ

10	ක්ෂය (හර) – රියදුරු ඉගැනුම් යන්ත්‍ර	32,194	
	උපචිත ක්ෂය - රියදුරු ඉගැනුම් යන්ත්‍ර		32,194
	(2018 වර්ෂය සඳහා රියදුරු ඉගැනුම් යන්ත්‍ර ක්ෂයවීම වාර්තාගත කිරීම)		
11	රියදුරු ඉගැනුම් යන්ත්‍ර	5,875,351	
	වෙනත් ගෙවියයුතු මුදල්		73,020
	වෙනත් ආදායම් - ප්‍රදාන		5,281,320
	පිරිසිදු කිරීමේ ගාස්තු		521,011
	(ජපන් රජයෙන් ප්‍රදානයක් ලෙස ලැබුණු යන්ත්‍ර හඳුනාගැනීම සහ 2018 වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගනිමින් මෙම වත්කම සඳහා කරන ලද ගෙවීම්වල දෝෂ නිවැරදි කිරීම		
12	ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී (හර)	1,873,972.60	
	ස්ථාවර තැන්පත් පොලී ආදායම් බැර		1,873,973
	(2018 වර්ෂයේ මිලියන 30 සහ මිලියන 40 පොලී ආදායම් වාර්තාගත කිරීම)		
13	ස්ථාවර තැන්පත් පොලී ආදායම (හර)	646,000	
	වෙනත් ආදායම් – ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන බැර		646,000
	(ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන පොලී ආදායම් ලෙස වාර්තාගත කිරීම නිවැරදි කිරීම.)		
14	විගණන ගාස්තු වියදම් (හර)	182,102	
	ගෙවියයුතු විගණන ගාස්තු බැර		182,102
	(2018 වර්ෂය සඳහා විගණන ගාස්තු ප්‍රතිපාදන යටතේ වාර්තාගත කර තිබීම)		
15	අරමුදල් ගිණුම – 2017 වර්ෂයේ ඉක්මවා ගිය වියදම	47,359.00	
	පිරිසිදු කිරීමේ ගාස්තු වියදම්		47,359
	(2017 වියදම් 2018 වියදමක් ලෙස වාර්තාගත කිරීම නිවැරදි කිරීම)		
16	අරමුදල් ගිණුම – 2017 වර්ෂයේ අතිරේක වියදම	451,998	
	අරමුදල් ගිණුම– 2018		451,998
	(2017 විවෘත කිරීමේ දී පැවති ශේෂයන් නිවැරදිකිරීම මත සම්මත වූ ජර්නල් ප්‍රවේශ නිවැරදි කිරීම)		
17	අරමුදල් ගිණුම –2017 වර්ෂයේ අතිරේක වියදම්	6,000	
	මුද්‍රණ සහ පරිවර්තන වියදම්		6,000
	(2017 වියදම් 2018 වියදම් ලෙසවාර්තාගත කිරීම නිවැරදි කිරීම)		
18	ඉදිරි ගෙවීම්	40,859	
	වාහන නඩත්තු වියදම්		40859
	(2018 වර්ෂයේ රක්ෂණ නැවත ගෙවීමක් වාර්තාගත කිරීම 2018 වර්ෂයේ වියදමක් ලෙස නිවැරදි කිරීම.)		
19	අරමුදල් ගිණුම – 2017 වර්ෂයේ අතිරික්ත වියදම	16,630	
	උපචිත ක්ෂය - පරිගණකය		16,630
	(2017 නොවැම්බර් 01 වන දින මිළ දීගන්නා ලද පරිගණක පහ මත වාර්තාගත නොකරන ලද ක්ෂය වාර්තාගත කිරීම)		
20	වෙනත් ආදායම් – ස්ථාවර තැන්පත් පොලී	7,420	
	ස්ථාවර තැන්පත් පොලී රැඳවුම් බදු වියදම් ගිණුම		7,420
	(රැඳවුම් බද්දෙන් අතිරික්ත පොලී ආදායම නිවැරදි කිරීම)		
21	වන්දි (හප්පා පළා යාම)	75,000	
	අරමුදල් ගිණුම – 2017 වර්ෂයේ අතිරික්ත වියදම		75,000
	(2017 වර්ෂයේ අවලංගු කරන ලද වන්දියක් 2018 වර්ෂයේ වන්දිවල අඩුවකිරීමක් ලෙස වාරතාගතකර තිබීම නිවැරදි කිරීම		
22	අරමුදල් ගිණුම – 2017 වර්ෂයේ අතිරේක වියදම	3,951,381	
	භාණ්ඡාගාර බිල්පත් ආයෝජන		3,951,381
	(2018 ගිණුම්වල හඳුනාගත් ආයෝජනවල දෝෂ නිවැරදි කිරීම)		
23	භාණ්ඩාගාර බිල්පත්වල ලැබියයුතු ආයෝජන	2,027,925	
	භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ගිණුම බැර		2,027,925
	(2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත්වල භාණ්ඩාගාර බිලිපත් ආයෝජන මත ලැබිය යුතු ආයෝජන වාර්තාගත කර තිබීම නිවැරදි කිරීම)		

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

සිටිපි/බී/එන්.සි.ආර්.එස්/01/ එෆ්.ඒ/19/04

2020 අගෝස්තු 27 දින

සභාපති,

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සටිස්නයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රධානත්වාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ

අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව හා සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජු හෝ අනක්‍රමාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ආ)	1971 අංක 31 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය හා පිරිඩි/12 චක්‍රලේඛයේ 5.2.4 ඡේදය	මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර සභාව විසින් අයවැය ලේඛණය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

03. අනෙකුත් විගණන නිරීක්ෂණ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී හදුනානොගත් වාහන අනතුරුවලින් සිදු වූ මරණ හා බරපතල අනතුරු වෙනුවෙන් රු. 7,400,000 ක මුදලක් වන්දි ගෙවා තිබූ අතර මෙම ගෙවීම් මාස 10 සිට මාස 36 ක කාල පරාසයක ප්‍රමාදයකින් යුක්තව ගෙවා තිබුණි. හදුනානොගත් වාහනවලින් අනතුරට පත් වූ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයේ උපදෙස් පත්‍රිකාව අනුව අවම වශයෙන් මාස 09 ක කාලසීමාව ඇතුලත සිදුකල යුතු වුවත්, අයදුම්පත් 09 ක් සඳහා වන්දි ගෙවීම් මාස 10 සිට මාස 26 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකාවද අත්සන්කරුවකු වන මාර්ග ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනා සම්මතයට අනුව රජය විසින් ඉටුකළ යුතු කාර්යයක් ලෙස මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) 2019 ක්‍රියාකාරී සැලැස්මේ මාර්ග ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති 10 ක් හා එය ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරකම් 30 ක් දක්වා තිබුණු අතර ඉන් සියයට 100 ක් ඉටු කර තිබුණේ ව්‍යාපෘති 03 කට අදාළ ක්‍රියාකාරකම් 11 ක් පමණි. ඉතිරි ව්‍යාපෘති 07 ඉටුකර ගැනීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ඈ) රක්ෂණ ආයතන සියළුම රක්ෂණ ඔප්පුවලින් සියයට 02 ක මුදලක් ගෙවීමට එකඟ වී ඇතත් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

(ඉ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව සභාව උපයාගත යුතු ආදායම රු. මිලියන 73 ක් වූ අතර සභාවේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 18.85 ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 54.15 ක්ද, වශයෙන් රු. මිලියන 73 ක් වෙන්කර දී තිබුණි. සභාව රු. මිලියන 74 ක ආදායමක් උපයාගෙන තිබුණද සභාවේ කාර්යයන් සඳහා රු. මිලියන 15 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් යෙදවීම අවම මට්ටමක පැවතුණි.

(ඊ) සභාවේ මාසික කාරක ප්‍රාග්‍යන අවශ්‍යතාවය රු. මිලියන 1.2 ක පමණ වුවත්, සභාවේ පංගම ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට රු. 62,878,499 ක ශේෂයක් පැවතුණු අතර අතිරික්ත මුදල් ඵලදායී කාර්යයක් සඳහා යොදවා නොතිබුණි.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගත යුතු වුවද, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස කටයුතු කරන අතර මෙම සභාව ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත නිලධාරීන් 11 ක ගෙන් හා කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගත් නිලධාරියෙකුගෙන් හා අනියම් කම්කරුවකුගෙන් සමන්විත විය.

(ඌ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද ක්‍රියාත්මකවීමේ දී පහත දුර්වලතා නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

<u>මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳ 1971 අංක 38 දරනමුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව.</u>

නීතිරීති විධිවිධාන යොමුව

(අ)2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය.

2019 වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති අතර,මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට මුලින්ම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්තුමන් විසින් උපදෙස් ලබා දීමෙන් අනතුරුව අදාල කාර්යය සිදු කරන ලදි. නමුත් 2019 වසරේ ජාතික සභාවට එය ඉදිරිපත් කිරීමට නොහැකි වුවත් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. 2020 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2020.02.28 දින පැවැත් වූ ප්‍රථම ජාතික සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ආ) 1971 අංක 31 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය හා පිඊඩි/12 චක්‍රලේඛයේ 5.2.4 ඡේදය.

විෂය භාර අමාත්‍යාංශයේ නව අමාත්‍යවරයා රාජකාරී භාර ගැනීමෙන් පසුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා නව සාමාජිකයින් පත් කිරීමේ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද අතර එසේ ජාතික සභාව සඳහා සාමාජිකයින් පත් කිරීමෙන් පසුව 2019.04.30 දින ජාතික සභාව කැඳවීමට කටයුතු කරන ලදී. එසේ වුවද ක්‍රියාකාරී සැළැස්මේ ඇතුලත් කාර්යයන් සඳහා වියදම්වෙනු ඇතැයි අපේක්ෂිත ඇස්තමේන්තු ගත මුදල් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීම නිසි පරිදි සිදු කර නොතිබූ බැවින්, එම තොරතුරු ඇතුලත් කර 2019.04.30 දින ජාතික සභාවේ අනුමැතිය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කලද අයවැය ඇස්තමේන්තුව එදින ජාතික සභාවට ඉදිරිපත් කිරීමට නොහැකි විය. සම්පූර්ණ කරණ ලද අයවැය ඇස්තමේන්තුව 2019 .07.09 දින පවත්වන ලද ජාතික සභා වාරයට ඉදිරිපත් කළද එය සංශෝධනය කර ඉදිරි සභාවාරයට ඉදිරිපත් කරන ලෙස සභාව විසින් දැනුම්දෙන ලදී. එම උපදෙස් හා සංශෝධන ඇතුලත් කර සකස් කරන ලද අයවැය වාර්තාව 2019.09.30 දින සභා වාරය සඳහා ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලදී. ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් ඇති නොවීමට සටහන් කර ගන්නා ලදී.

අනකුත් විගණන නිරීක්ෂණ

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් මූල්‍ය සහන ලබා දෙන්නේ හඳුනා නොගත් වාහන වලින් සිදු වන අනතුරු සඳහා පමණි. ඒ අනුව හප්පා පලා යාමක් ලෙස තහවුරු කර ගැනීම තීන්දු කරනු ලබන්නේ අවසාන වශයෙන් ලබා ගන්නා පොලිස් වාර්තාව මගිනි.එම පොලිස් වාර්තාව ලබා දීමට ශ්‍රී ලංකා පොලීසිය මාස 06 පමණ කාලයක් ලබා ගනියි. එසේ ලබා ගන්නා වාර්ථාව පදනම් කර ගෙන ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.

(ආ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම රජය විසින් ජාතිය වෙනුවෙන් ඉටුකළ යුතු කාර්යක් ලෙස නිර්දේශ කර තිබුණද, ඒ සඳහා බලය සහිත ආයතනයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය මෙතෙක් සම්පූර්ණ වී නොමැත. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් බවට පත් කිරීම සඳහා අමාත්‍යාංශය සමග එක්ව කටයුතු කරන අතර, 2020.01.13 දින කැබිනට් මණ්ඩලය වෙත පනත් කෙටුම්පත නැවත ඉදිරිපත් කළ අවස්ථාවේදී මුදල් ,ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් නිර්දේශ කර ඇත්තේ මෙම සභාව ක්‍රියාත්මක වන ආකාරයට ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සොයා බලන ලෙසයි. ඒ පිළිබඳව නැවත කැබිනට් මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඊට අදාල කටයුතු මේ වන සිදු කරමින් පවතී.

(ඇ) 2019 ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර ඇති මාර්ග ආරක්ෂාව කළමනාකරණය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා දක්වා ඇති ව්‍යාපෘති 10ට අදාල ඇතැම් ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ සම්බන්ධයෙන් පහත කරුණු ඉදිරිපත් කරමි.

ඒ අනුව 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ වර්ෂයක් තුළ ක්‍රියාත්මක කිරීමට අපෙක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කර සකස් කළ නමුත් නව අමාත්‍යවරයෙක් යටතේ ජාතික සභාවට නව සාමාජිකයින් පත් කිරීමෙන් අනතුරුව පලමු ජාතික සභා රැස්වීම 2019.04.30 දින පවත්වන ලද අතර, පලමු ජාතික සභාවේ අනුමැතිය ලද ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශ ලේකම්තුමා විසින් 2019.07.09 දින අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අදාල අනුමැතිය ලබා දීමට පෙර කාලපරිච්ඡේදය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ඉටු කිරීමට නොහැකි විය.

එමෙන්ම 2019 වර්ෂයේ අප්‍රේල් මාසය තුළ සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් ද යම් යම් ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළුවක් ඇති විය. (පිරිස් ඒකරාශී කරමින් වැඩසටහන් සිදු කිරීම කළ නොහැකිවීම) එසේම වර්ෂ අවසාන කාලයේදී ජනාධිපතිවරණයට දින නියම කිරීමත් සමග මැතිවරණ නීතිරීති වලට අනුගතව කටයුතු කිරීමට සිදු වීම නිසා ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියෙහි අඩුවක් පැවතුණි. කෙසේ වෙතත් ඉහත සීමාවන් බල නොපාන ලද ඇතැම් ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇත.

(ඈ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට තුන්වන පාර්ශවයේ රක්ෂණ ආවරණයන්ගේ වටිනාකමින් 1%ක ප්‍රතිශතයක් දායක මුදල් ලෙස ලැබේ. මෙම ප්‍රතිශතය 2% දක්වා ඉහළ දැමීම පිළිබඳව ජාතික සභාව විසින් අදාල රක්ෂණ ආයතන සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඒ සඳහා වන හකඟතාවය ලබා ලන්නා ලදී. එසේ වුවද අදාල රක්ෂණ ආයතන වෙතින් තනි තනිව එකඟත්වය ලිඛිතව ලබාගෙන ඉදිරියේදී එය නීතිගත කිරීමට අවශය කටයුතු සිදු කරනු ලැබීමට නියමිතය.

(ඉ) ජාතික සභාවේ මූලික කාර්යක් වන්නේ හප්පා පලා යාමෙන් අනතුරට පත් වන පුද්ගලයින් සඳහා මූල්‍ය සහන පිරිනැමීමයි. එම කාර්ය සඳහා මූල්‍ය සහන ලබා දෙනු ලබන්නේ ඉල්ලුම් කරනු ලබන අයදුම් පත් ප්‍රමාණය සභාව විසින් ක්‍රියාත්මක ක්‍රියාදාමයට යොමු කර අවසානයේ සුදුසුකම් ලබන අයදුම්පත් සඳහා පමණි. මෙයට අමතරව ජාතික සභාවේ සාමාන්‍ය පරිපාලන වියදම් සහ මාර්ග අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් සැලසුම් කරනු ලබන වැඩසටහන් හා අමාත්‍යාංශය මඟින් යොමු කරනු ලබන ජාතික වැඩසටහන් සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදලෙන් මුදල් වැය කරනු ලැබේ.

(ඊ) මුදල් පොතේ ශේෂයෙන් මිලියන් 44 මුදලක් 2020.02.20 දින ස්ථාවර තැන්පත් වල තැන්පත් කිරීමට කටයුතු කර ඇත.

(උ) මේ වන විට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ රාජකාරී කටයුතු සිදු කරනු ලබන්නේ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනක් ලෙසයි. මෙහි කාර්ය මණ්ඩලය සපුරාගෙන ඇත්තේ ඒකාබද්ධ සේවය, දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යන ආයතන වලින් අනුයුක්ත කරගෙන ඇති නිලධාරී මණ්ඩලයක් මගිනි. ඉදිරියේදී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ ජාතික කොමිසම බවට පත් කිරීමෙන් අනතුරුව ආයතනය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම කටයුතු කරනු ලැබේ.

(ඌ) තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රයට අනුගතව කටයුතු කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ලෙස දැනටමත් යම් යම් කාර්යන් ඉටු කර ඇත. ජාතික සභාව විසින් සිදු කරනු ලබන සියලු කාර්යන් මගින් ලංකාව මාර්ග අනතුරු අවම රටක් බවට පත් කිරීම ඉලක්කයයි.

පාසල් ළමුන් සහ විවිධ ක්ෂේත්‍ර වලට අයත් කණ්ඩායම් දැනුවත් කිරීම, පර්යේෂණ හා සමීක්ෂණ සිදු කිරීම, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ දැනුම හුවමාරු කර ගැනීම හප්පා පලා යෑම නිසා වින්දිතභාවයට පත්වුවන් සඳහා මූල්‍ය සහන පිරිනැමීම, දුම්රිය හරස් මාර්ග අනාරක්ෂිතභාවය අවම කිරීමට කටයුතු කිරීම, හෙල්මට් ප්‍රමිතිකරණය කිරීම වැනි තාක්ෂණික දුර්වලතා නිවැරදි කිරීමට අදාල බොහෝ කාර්යන් සිදු කර ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟා වීමේදී ඊට අදාල කාර්ය සාධනය මැනීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

දැනටමත් ශ්‍රී ලංකා පොලීසිය, දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සෞඛය අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතන හා ලෝක සෞඛ්‍ය සංවිධානය රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධ වෙමින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්ය සිදු කරමින් පවතින අතර, ඉදිරියේදී මෙම තත්වය වඩාත් සාර්ථක ලෙස සිදු කරමින් ඉලක්කකරගත් අරමුණු කරා කළා වීමට අපෙක්ෂා කෙරේ.

මෙම දුර්වලතා මගහරවා ගනිමින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇත.



ආර්.එල්. ඇන්ටන් ද මෙන්ස්,
සභාපති.
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.